**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මතය

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### (අ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය<br>වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ගණකාධිකාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (අ) මුදල් රෙගුලාසි 104(3) සහ 104(4) | 168,739 | අනතුරු සම්බන්ධයෙන් පූර්ණ වාර්තාව ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේනම් ප්‍රාරම්භක වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ. තවද, පූර්ණ වාර්තාව අලාභහානිය සිදුවූ දිනයේ සිට තුන් මසක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වේ. ප්‍රාදේශීය ලේකම් කාර්යාල 08 කට අදාල වාහන 08 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම මෙම වාහන තුනකට අදාලව අලාභයන් අදාල වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකරගෙන නොතිබුණි. | ප්‍රාරම්භක සහ පූර්ණ වාර්තා නිසි වෙලාවට ඉදිරිපත් කිරීම ප්‍රමාද වී ඇති බැවින්, මෙවන් ප්‍රමාදයන් ඇති නොවීමට වග බලා ගන්නා බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අනතුරු සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ආ) මුදල් රෙගුලාසි 137(i) හා (v) 215(i) හා 237(iii) | 2,485,911 | පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සැපයුම් ලැබී නොතිබියදී ලියන ලද චෙක්පත් 22 ක් ආදායකයින් වෙත නිකුත් නොකර දින 35 සිට 43 දක්වා කාලයක් අත රඳවාගෙන තිබුණි. | සීමිත වෙළඳ පහසුකම් මත භාණ්ඩ ඇණවුම් කර ලබා ගැනීමේදී අපහසුතා පැන නැගී තිබූ බැවින් ගෙවීම් කිරීමට නොහැකි වූ අතර වර්ෂය අවසානයේ ලබාදෙන ලද ප්‍රතිපාදන හා අක්මුදල් වර්ෂය අවසානය වන විට ප්‍රයෝජනයට ගත යුතු වීම මීට හේතු විය. | මුදල් රෙගුලාසි පරිදි සැපයුම් ලැබීමෙන් පසු ගෙවීම් කළ යුතුය. |
| (iii) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ---------------- | | | | |
| | (අ) 2021 ජනවාරි 11 දිනැතිව අංක MF/NPD/01/ 2021 දරන හා 2021 පෙබරවාරි 10 දිනැති අංක MF/NPD/01/ 2021(i) දරන මුදල් අමාත්‍යාංශ ලේකම්වරයා ගේ චක්‍රලේඛ | | අපේක්ෂිත ක්ෂේත්‍රයන් කෙරෙහි අවධානය යොමු නොකර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් විසින් ප්‍රජා මූල සංවිධාන සඳහා මුළු විමධ්‍යගත ප්‍රතිපාදන වියදමෙන් සියයට 41 ක් ලබාදී තිබූ අතර, චක්‍රලේඛයෙන්හි දක්වා ඇති ක්ෂේත්‍ර 13 ම ආවරණය වන ලෙස ප්‍රතිපාදනයන් වෙන්කර නොතිබුණි. | ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රී වරුන් වෙත පැවරීම හේතුවෙන් සියලුම ක්ෂේත්‍ර ආවරණය නොවීම සිදු විය. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) 2021 ජනවාරි 11 දිනැති මුදල් අමාත්‍යාංශ ලේකම්වරයාගේ අංක.MFNDP/01/2021 දරන චක්‍රලේඛය -------------- | | | | | |
| i. 2 ඡේදය | 10,806,441 | පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ සම්පූර්ණ ප්‍රතිපාදනයෙන් සියයට 50 ක අවමයක් හෙවත් රු.මිලියන 05 ක් භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්) සඳහා වෙන් නොකර පඩුවස්නුවර (බටහිර), බමුණාකොටුව සහ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල දහම් පාසල් හා පන්සල් සංවර්ධනය සහ ලියාපදිංචි සමිති සඳහා භාණ්ඩ බෙදාදීම් වෙනුවෙන් රු.10,806,441 ක් එනම් සියයට 72 ක් වැයකර තිබුණි. | ප්‍රතිපාදන මුදලින් අවමය සියයට 50 ක් ඉදිකිරීම් ව්‍යාපෘති හා උපරිමය සියයට 50 ක් සමාජ ආර්ථික හා ආධ්‍යාත්මික සංවර්ධනය ඉලක්ක කරගත් මිලදී ගැනීම් ව්‍යාපෘති යෝජනා තෝරා ගන්නා ලෙස උපදෙස් ලබාදී ඇත. | - | එම - |
| ii. 2.4 ඡේදය | 2,277,068 | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ජනගහනය, දරිද්‍රතාවය සහ භූමි ප්‍රමාණය යන සාධක පදනම් කරගෙන විමධ්‍යගත මන්ත්‍රී ප්‍රතිපාදන බෙදී යන පරිදි ව්‍යාපෘති තෝරාගෙන ක්‍රියාත්මක නොකර 2021 වර්ෂය තුළදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක | අවුරුද්දක් තුළ වෙන් කරන ප්‍රතිපාදන මුදල ප්‍රමාණවත් නොවන බැවින් විවිධ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ එම අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රජාව විසින් ඉල්ලීම් ඉදිරිපත් කර තිබීම හේතුවෙන් එකම සමිතිවලට | - | එම - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | සමිති 37 කට අවස්ථා 80 කදී සහ 2019 වර්ෂය සමඟ සැසඳීමේදී සමිති 27 කට අවස්ථා 27 කදී භාණ්ඩ එකම සමිතිවලට ලබාදී තිබුණි. | භාණ්ඩ ලබාදීමට සිදුව ඇත. | |
| (iv) | වෙනත් චක්‍රලේඛ<br>-------------------- | | | | |
| | (අ) බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ MDTF/Trg/mgt/03 (i) ජේදය හා 2020 නොවැම්බර් 25 දිනැති ලිපියේ අංක 03 (අ) ජේදය | | අවම අධ්‍යාපන මට්ටම වන 8 ශ්‍රේණිය සපුරා නොමැති අයදුම්කරුවන් 3 දෙනෙකු හා අදාල සුදුසුකම්වලට ඉහළ සුදුසුකම් වන අ.පො.ස.(සා.පෙළ) සමත් අයදුම්කරුවන් 11 දෙනෙකු චක්‍රලේඛයේ විධිවිධානවලින් බැහැරව කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය සඳහා බහුකාර්ය සංවර්ධන පුහුණුලාභීන් ලෙස බඳවාගෙන තිබුණි. | අ.පො.ස.(සා.පෙළ) සමත්වූ බව තහවුරු වූ පසු තාවකාලිකව පුහුණු කටයුතු අත් හිටුවා තිබුණ අතර, ලැබුණු උපදෙස් අනුව එම පුහුණුලාභීන් නැවත සේවයට කැඳවා හිඟ දීමනාද ගෙවා ඇත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව අයදුම්කරුවන් බඳවාගත යුතුය. |
| | (ආ) සමෘද්ධි මාර්ගෝපදේශ සංග්‍රහය 2021/1 | | ව්‍යාපාති ක්‍රියාත්මක කිරීම ආර්ථික සංවර්ධන නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්ට පැවරෙන බැවින් ප්‍රතිලාභීන් සම්බන්ධ සියලු තොරතුරු ඔවුන් සතු ක්ෂේත්‍ර පොතේ සටහන් කර අවශ්‍ය වේලාවේදී විගණනයට ලබාදීමට ක්‍රියාකළ යුතු අතර, එහි එක් එක් දිනවලදී ප්‍රතිලාභීන්ගේ | ව්‍යාපෘති ක්‍රියාත්මක වසම්වලින් තෝරාගන්නා ලද ව්‍යාපෘති ලාභීන්ගේ තොරතුරු තමන්ගේ ක්ෂේත්‍ර සටහන් පොත්වල තබාගන්නා ලෙස සහ පසුවිපරම් කළයුතු බවට උපදෙස් ලබාදී ඇති බව. | ආර්ථික සංවර්ධන සහ සමෘද්ධි සංවර්ධන නිලධාරීන් මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන්ට අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ජීවනෝපාය වර්ධනයවීමට අදාල සටහන් පවත්වාගෙන යා යුතු වුවද එසේ කර නොතිබුණි. | | |
| (ඇ) ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2018 මාර්තු 25 දිනැති අංක 01/2018 දරන චක්‍රලේඛය | ග්‍රාම නිලධාරීන් විසින් තම ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් දෙසති වාර්තා මගින් ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් ග්‍රාම නිලධාරීන් විසින් ඒ සම්බන්ධ වාර්තා ප්‍රාදේශීය ලේකම්වරයා වෙත ලබාදී නොතිබුණ අතර, එවැනි ඉදිකිරීම් නොමැති අවස්ථාවල හිස් වාර්තා ලබාදීමටද කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් විසින් කළයුතු වාර්තා කිරීම් නිසි පරිදි ප්‍රාදේශීය ලේකම් වෙත යොමු කිරීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛවල නියමයන්ට අනුව ග්‍රාම නිලධාරීන් විසින් දෙසති වාර්තා නියමිත පරිදි පවත්වාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වී මිලදී ගැනීමට හා කාබනික පොහොර නිෂ්පාදනය ආශ්‍රිත කටයුතු යන වෙනත් වැය විෂයයන් සඳහා වාර්ෂික අයවැයගත ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර, පිළිවෙලින් රු.65,000,000 ක් හා රු.100,000,000 ක් වශයෙන් පරිපූරක ඇස්තමේන්තු යටතේ ගත ප්‍රතිපාදන මෙම වැය විෂයයන් දෙක සඳහා ලබාගෙන තිබුණ අතර, එයින් වර්ෂය තුළ වියදම් දැරූ පසු රු.63,591,862 ක් හා රු.94,565,000 ක් ප්‍රතිපාදන වර්ෂය තුළ උපයෝජනය කර නොතිබුණි. | ප්‍රතිපාදන නිසි පරිදි යෙදවීමට උත්සාහ ගත්තත් ගොවීන් විසින් රජයට වී අළෙවි කිරීමට දැක්වූ අකමැත්ත සහ පෞද්ගලික අංශයට අපහසුවකින් තොරව වී විකිණීමට හැකිවීම හා කාබණික පොහොර නිෂ්පාදනයට ලබාදුන් රු.මි.100 න් රු.මි.5 ක් යොදාගෙන චොපර් මැෂින් 20 ක් මිලදී ගැනීම පමණක් සිදුකර ඇත. | ලැබෙන ප්‍රතිපාදන හැකිතාක් දුරට ඵලදායි ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වැය විෂයය අංක 272-1-2-1001 හා 272-1-2-1002 සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ රු.617,000 ක් හා රු.773,000 ක් මාරු කරගෙන තිබුණ අතර, එම වැය විෂයයන් දෙකෙහි ඉතිරිය පිළිවෙලින් රු.1,699,600 ක් හා රු.1,962,214 ක්ව පැවතුණ බැවින්, එම ඉතිරිය වැඩිකළ ප්‍රතිපාදනයෙන් සියයට 275 ක් හා 254 ක් වූයෙන් කිසිදු අවශ්‍යතාවයකින් තොරව ප්‍රතිපාදන මාරුකරගෙන තිබූ බව නිරීක්ෂණය විය. | ප්‍රතිපාදන මාරු කිරීමේදී අවශ්‍යතාවය ගණනය කර එවන ලෙස දක්වා ඇතත් නිසි පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මෙය ඉටු නොකිරීම නිසා මෙම අඩුපාඩු සිදුවී ඇත. | ඇස්තමේන්තු ප්‍රතිපාදන නිසි පරිදි කළමනාකරණය කළයුතු වීම. |

## 2.2 වෙනත් අමාත්‍යාංශය හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක්ම සිය මුදල් වර්ෂයට අදාලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාවට නැංවිය යුතු වුවද, එම ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් අමාත්‍යාංශ 15 කින් හා දෙපාර්තමේන්තු 08 කින් ලද ප්‍රතිපාදනවලින් රු.1,255,751,480 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. | අමාත්‍යාංශ 15 කින් හා දෙපාර්තමේන්තු 08 කින් ලද ප්‍රතිපාදනවලින් කොවිඩ් 19 ව්‍යසන තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘතිවල කටයුතු නිවසේ සිට සිදු කිරීම, සංචරණ සීමා වර්ෂය පුරා වරින් වර පැවතීම, පිරිස් ඒකරාශී කිරීම අවම කිරීම, ගමන් වියදම් සීමාවීම් වැනි හේතු නිසා බලාපොරොත්තු පරිදි වැඩ සටහන් පැවැත්වීමට නොහැකිවීම බලපා ඇත. | වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවලින් ලබාදෙන ප්‍රතිපාදනයන් කල්වේලා ඇතිව ලබාගැනීම සඳහා නිසි වැඩ පිළිවෙලක් සකස් කළයුතු අතර ලැබෙන ප්‍රතිපාදනයන් හැකිතාක් දුරට උපයෝජනය කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) අමාත්‍යාංශ 03 කින් හා දෙපාර්තමේන්තු 06 කින් ලද ප්‍රතිපාදනවලින් එකතුව රු.14,896,459 ක ප්‍රතිපාදන සියයට 100 ම කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොතිබුණි. ඒ හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති අරමුණු ඉටුවී නොතිබුණි. | ප්‍රතිපාදන සංශෝධනය කිරීමට අනුමැතිය ලබා නොදීම නිසා සහ අදාල වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම හේතු ලෙස බලපා ඇත. | අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලින් ලැබෙන ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කළ යුතුය. |

## 2.3 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල හතරකට අදාලව මිය ගිය නිලධාරීන් 04 දෙනෙකුගෙන් 2021 දෙසැම්බර් 31 දිනට වන විට රු.396,674 ක ණය ශේෂයන් අයවිය යුතුව පැවති අතර, රිදීගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරිණියකගේ ණය ශේෂය වන රු.211,131 ක් වර්ෂ 17 මාස 07 ක කාලයක් සිට පැවතුණි. එම ණය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 24 පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මියගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.396,674 ක පවතින ණය ශේෂ අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | අය නොවී පවතින ණය ශේෂ අයකර ගැනීම සඳහා ගතයුතු පියවරයන් කාර්යක්ෂමව ගත යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එයට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක ගිණුම් අංක 6000-0-0-16-0-42 යටතේ වූ කොන්ත්‍රාත් රඳවුම් මුදල් රු.80,396,403 ක් වර්ෂ 02 සිට 05 දක්වා කාලයක් නිදහස් කිරීමට කටයුතු නොකර පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 22 ක වර්ෂ 2 සිට 5 අතර පවතින රඳවුම් මුදල්වලින් රු.මිලියන 24.6 ක් නිදහස් කර අවසන් බැවින් ඉතිරි රු.මිලියන 59.2 අක් මුදල් ලැබුණු පසු නිදහස් කිරීමට කටයුතු කර ඇත. | කල් ඉකුත් වූ තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 දැක්ම හා මෙහෙවර

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන අරමුණු අතර ගිනි අවි බලපත්‍ර අලුත් කිරීම ඇතුළත්ව තිබුණද, 2021 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අදාලව ගිනි අවි 726 ක වාර්ෂික බලපත්‍ර අලුත් කර නොතිබුණි. | 2021 වර්ෂයේ ගිනි අවි වාර්ෂික බලපත්‍ර 2022 වර්ෂයේදී අළුත්කිරීම සිදුකර ඇත. | වාර්ෂිකව ගිනිඅවි බලපත්‍ර අලුත් කළ යුතුය. |

**3.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ අංක 1345- මීගස්පිටිය වසමේ රසකැවිලි හා අත්කම් භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපෘතියක් සඳහා රු.3,223,218 ක මුදලක් වැයකර මෙම වටිනාකමින් රු.2,507,218 වටිනා ගම්මානය සඳහා මාර්ග 02 ක් සකස් කර තිබූ අතර, එම මාර්ග 02 හි සෘජු ප්‍රතිලාභ ලබන මුළු පවුල් සංඛ්‍යාව 06 ක් වීමෙන් වැඩි ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සහිත ග්‍රාමීය මාර්ගයක් සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමුවී නොතිබුණි. | මෙම මාර්ග දෙක බොහෝ සෙයින් අබලන්වූ මාර්ග නිසා අත්‍යවශ්‍යයෙන් සංවර්ධනය කළයුතු මාර්ග බැවින් සකස් කර තිබූ අතර, මෙම මාර්ග දෙපස වැඩි පවුල් සංඛ්‍යාවක් වාසය කරනු ලබන බව. | ව්‍යාපෘති ඉටු කිරීමේදී වැඩි ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට ව්‍යාපෘති තෝරා ගත යුතුය. |
| (ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් රු.2,108,552 ක් වැයකර 2015 වර්ෂයේදී නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තිඹිරියාව, වඳුරුස්ස ග්‍රාමයෙහි ඉදිකර තිබූ පානීය ජල ළිඳෙහි ජලය බීමට නුසුදුසු බව 2021 නොවැම්බර් 22 දින සිදුකළ විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ අතර, මෙම ප්‍රදේශයේ පදිංචි පවුල් 20 ක ජල අවශ්‍යතාවය සපුරාලීමට නොහැකි බැවින් ළිඳ ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුව නොතිබුණි. | පානීය ජලය සපුරාගැනීම සඳහා එම ප්‍රතිලාභීන් උනන්දු කිරීමක් ලෙස පිරිපහදු කිරීමේ කට්ටල භාවිතා කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදි.<br>පසුගිය වර්ෂ දෙකක පමණ මෙම ප්‍රදේශයට වර්ෂය පුරා වර්ෂාව පැවතීම නිසා ජල මූලාශ්‍ර බහුල වූ බැවින් මෙම ළිඳ භාවිතා කිරීම අඩුවී ඇත. | ව්‍යාපෘති ඵලදායී සහ අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |
| (ඇ) පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සෞභාග්‍යා නිෂ්පාදන ගම්මාන ව්‍යාපෘතිය යටතේ රු.2,109,616 වියදමින් ඉදිකළ කෝන්ගහමුල මීගස්පිටිය මාර්ගය වෙනත් කිසිදු මාර්ගයකට සම්බන්ධ නොවී පෞද්ගලික ඉඩමකින් අවසන් වී තිබූ අතර, මාර්ගයේ මුළු වටිනාකමින් රු.435,987 ක් වැයකර ඉදිකර තිබූ දකුණු පස කාණුව දැඩි අනාරක්ෂිත තත්ත්වයේ පැවතුණි. | මාර්ගය අවසන් වන ඉඩම අයිතිකරුවන් තිදෙනකුට අයත් පුද්ගලික ඉඩමක් බවත්, ඉදිරියේදී මෙම මාර්ගයට කාණු පද්ධතියක් හා බෝක්කු පද්ධතියක් ස්ථාපිත කිරීමට නියමිතව ඇත. | ව්‍යාපෘති ඵලදායී සහ අරමුණු ඉටුවන ආකාරයට ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක වර්ෂය තුළ ක්‍රියාවට නංවන ලද සපිරිගමක් සංවර්ධන වැඩසටහන හා ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහනේ මුළු ව්‍යාපෘති 1,159 ක් සඳහා වැයකළ මුදල රු.905,975,386 ක් විය. ඉන් රු.802,594,963 ක් හෙවත් සියයට 89 ක් වැයකර තිබුණේ මාර්ග ඉදිකිරීම් ඇතුළත් වූ ක්ෂේත්‍රයට පමණක් වූ බැවින් මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 06 දිනැති හා අංක 01/2019 චක්‍රලේඛයේ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව ග්‍රාමීය සංවර්ධනය තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කර කේන්ද්‍රීය ආර්ථිකයක් බිහි කිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. | සංවර්ධන යෝජනා ඉදිරියේදී ලබා ගැනීමේදී විධිමත් ආකාරයෙන් සාර්ව ආර්ථික අරමුණු මුදුන්පත්වන පරිදි ලබාගැනීමට අදාල ග්‍රාමීය කමිටු දැනුවත් කර ඇත. | ව්‍යාපෘති ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂව සහ ඵලදායී ආකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාලීමට හැකිවන ආකාරයට ඉටු කළ යුතුය. |
| (ඉ) | ග්‍රාමීය ක්‍රීඩා පිටි සංවර්ධන වැඩසටහන - 2018 යටතේ කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලහිටියාව ග්‍රාම නිලධාරී වසමේ සැන්ට්පෝට් වත්ත ක්‍රීඩාංගනය ඉදිරිකිරීම සඳහා රු.1,936,188 ක මුදලක් ගෙවා තිබුණ අතර, ක්‍රීඩාපිටිය වල් බිහිවී භාවිතයට ගැනීමට නුසුදුසු තත්ත්වයක පැවතුණි. | කුලියාපිටිය ප්‍රාදේශීය සභාව විසින් ඉටුකරන ලද මෙම ක්රීඩාංගනයේ අඩුපාඩු සම්පූර්ණ කරන ලෙස ප්‍රාදේශීය ලේකම් විසින් දැනුම්දී ඇත. | ව්‍යාපෘති ඉටුකිරීමේදී ආර්ථිකමය, කාර්යක්ෂව සහ ඵලදායී අකාරයට අපේක්ෂිත ප්‍රතිලාභ සපුරාලීමට හැකිවන ආකාරයට ඉටු කළ යුතුය. |
| (ඊ) | බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කටුපොත පොලිසිය පිහිටි ස්ථානයේ කළුගල් සහිත ඉඩමක ක්‍රීඩාංගනයක් ඉදිකිරීම සඳහා තෝරාගෙන මූලික කාර්යය වන පස් පිරවීමෙන් සියයට 41 ක් සිදුකර ඉඩම වටා දැල් ගසා එම කාර්යයන් වෙනුවෙන් රු.1,470,000 ක මුදලක් වැය කර තිබුණි. පස් සම්පූර්ණයෙන් පුරවා නොතිබීම හේතුවෙන් හා මෙම ස්ථානයට මීටර් 500 ක් නුදුරින් තවත් පහසුකම් සහිත ක්‍රීඩාංගනයක් තිබීම හේතුවෙන් මෙම ක්‍රීඩාංගනය නිෂ්කාර්යව පැවතුණි. | ක්‍රීඩාංගනයේ පස් පිරවීම සිදුකර පාවිච්චියට සුදුසු මට්ටමට පත්කරන ලෙස වාරියපොල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට දැනුම් දීම සිදුකර ඇති අතර සභා බල ප්‍රදේශයේ ක්‍රීඩා කටයුතු සඳහා ක්‍රීඩාපිටිය යොදා ගැනීමේ ගැටලු පවතින බවත් දන්වා ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (උ) | කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2021 ඔක්තෝබර් 01 දින රු.100,000,000 ප්‍රතිපාදනයන් ලබාදී තිබුණි. වර්ෂය අවසාන වන විට ඉන් රු.5,404,000 ක් වැයකර කැබලි කිරීමේ යන්ත්‍ර 20 ක් (මල්ටි චොපර්) ලබාගෙන තිබුණද, විගණන දිනය වූ 2022 අප්‍රේල් මස 06 යන්ත්‍ර ලැබී තිබුණද ඒවා භාවිතයට ගෙන නොතිබුණි. තවද රු.94,596,000 ක ප්‍රතිපාදන නැවත හරවා යවා තිබුණි. මේ අනුව ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | කාබනික පොහොර නිෂ්පාදනයට අවශ්‍ය මල්ටිචොපර් යන්ත්‍ර 56 ක් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද, 20 ක් පමණක් මිලදී ගැනීම හේතුවෙන් ඉතිරි ප්‍රතිපාදනය වන රු.94,596,000 ක් භාණ්ඩාගාරයේ ජාතික අයවැය අධ්‍යක්ෂ වෙත යැවීමට සිදුවිය. | ප්‍රතිපාදනවලින් අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකි ආකාරයට උපයෝජනය කළ යුතුය. |
| (ඌ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක් මඟින් සිදුකළ ව්‍යාපෘති 07 ක් සඳහා රු.11,185,891 ක් වැයකර තිබුණද, ව්‍යාපෘති ක්‍රියාත්මක තත්ත්වයට වැඩ නිමකර නොතිබුණි. | මුදල් ප්‍රතිපාදන නොමැතිකම නිසා මෙම ව්‍යාපෘති නිම කිරීමට නොහැකි විය. | ව්‍යාපෘති නිමකර අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 වර්ෂයේ සපිරි ගමක් ව්‍යාපෘතිය යටතේ නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 05 ක ජල නල පද්ධති සඳහා 2020 දෙසැම්බර් 29 දින රු.5,424,036 ක් ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත ගෙවීම් කර තිබුණද, ව්‍යාපෘතිය විගණන දින වූ 2022 දෙසැම්බර් 29 දින දක්වා නිම කර නොතිබුණි. | ජල සම්පත් හා ජලපවාහන මණ්ඩලය වෙත ජල ව්‍යාපෘතිවල නල එළීමේ කටයුතු කඩිනමින් සකස් කර දෙන ලෙස වරින් වර දැනුම් දී ඇත. | ව්‍යාපෘති ප්‍රමාදයකින් තොරව ඉටු කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ග්‍රාම නිලධාරී වසම් 03 ක් සඳහා ග්‍රාමීය කමිටු විසින් හඳුනාගෙන ක්‍රියාවට නැංවිය යුතු රු.3,000,000 ක් වටිනා ජලනල එළීමේ ව්‍යාපෘති තුනක් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී තිබුණි. | ජලනල උපාංග හිඟකම මත ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නොහැකි වී ඇති බව ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් දැනුම් දී ඇත. | - එම - |

**3.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක පසුගාමී ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නගා සිටුවීම වෙනුවෙන් උඳු හා මුං භෝග වගා ව්‍යාපෘතියක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියෙන් අපේක්ෂිත මුළු උඳු හා මුං අස්වැන්න වන කිලෝග්‍රෑම් 256,200 කින් ලැබී තිබුණේ කිලෝග්‍රෑම් 52,873 ක් හෙවත් සියයට 20 ක පමණ අඩු අස්වැන්නක් විය. මේ අනුව ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගෙන නොතිබුණි. | 2021 මහ කන්නය ආරම්භ කර දී ප්‍රතිපාදන ලැබුණු මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී අධික වර්ෂාව හේතුවෙන් ඉලක්කය කරා ළඟාවීමට නොහැකි වී ඇත. | ව්‍යාපෘතිවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත හැකිවන පරිදි හා අරමුණු ඉටු කර ගත හැකි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) රාජ්‍ය ආරක්ෂක ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2020/2021 මහ කන්නයේ වී මිලදී ගැනීම සඳහා රු.50,000,000 ක් 2021 පෙබරවාරි 16 දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී තිබුණු අතර, ඉන් රු.1,408,137 ක් තිබුණි. ඒ අනුව එම කාර්යය සඳහා යොදවාගෙන රු.48,591,862 ක් එනම් මුළු මුදලෙන් සියයට 97 ක් ප්‍රයෝජනයට නොගෙන 2021 ජූනි 07 දින නැවත භාණ්ඩාගාරය වෙත ලබාදී තිබුණි. | වී මිලදී ගැනීමේදී වී අලෙවි මණ්ඩලය විසින් ගොවීන්ගෙන් වැඩි මිලට සෘජුවම වී මිලදී ගැනීම සහ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හරහා මිලදී ගැනීමේදී රජයේ බැංකු මඟින් ගොවීන් වෙත මුදල් ලබා ගැනීම සඳහා යොමු කිරීම වැනි හේතුන් නිසා වී මිලදී ගැනීමට නොහැකි වීම. | ලබාදුන් ප්‍රතිපාදනවලින් අපේක්ෂිත අරමුණ ඉටුකරවා ගත යුතු වීම. |

**3.5** වාර්ෂික කාර්ය සාධන වාර්තාව

-----------------------------------

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි.

ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ග්‍රාමීයව ඉදිකළ යුතු සතිපොලවල්, අලෙවි මධ්‍යස්ථාන ඉදිකිරීම් හා නිවාස සඳහා සූර්ය පැනල සවි කිරීමේ යන සංරචක දෙකෙහි අපේක්ෂිත නිමවුම් මට්ටම සියයට 49 කට අඩු මට්ටමේ පැවතුණ අතර, මෙම සංරචක ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබුණි. මෙහි වෙන්කළ ප්‍රතිපාදන හෝ වර්ෂය අවසානයේ නිමි ව්‍යාපෘති සංඛ්‍යාව හා වටිනාකම් දක්වා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කරන වැඩ සටහන් පාදක කරගෙන ක්‍රියාකාරී සැලැස්මේ සංරචක සකස් කර ඇති බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාත්මක කළ යුතුවීම. |
| (ආ) තවද ප්‍රවේශ මාර්ග ඉදිකිරීම හා ග්‍රාමීය ජල සැපයුම් යන සංරචක දෙකෙහි නිමි ප්‍රතිශතය සියයට 50- 75 ක් අතරද, ක්‍රීඩාපිටි ආගමික මධ්‍යස්ථාන සංවර්ධනය හා සමාජ සුභසාධන යන සංරචක 03 හි නිමි ප්‍රතිශතය සියයට 75-89 ක් අතරද, සනීපාරක්ෂක පහසුකම් සැපයීම, නිවාස සංවර්ධනය හා වෙනත් යන සංරචක තුනහි නිමි ප්‍රතිශතය සියයට 90-100 ත් අතර පැවතුණද, මෙම සංරචක කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ අන්තර්ගත නොවීම හා කාර්යසාධන දර්ශක නිමි ප්‍රතිශතය පිළියෙල කිරීම සඳහා නිමි ව්‍යාපෘති සංඛ්‍යාව කෙතෙක්ද යන්න හා ඒ සඳහා දරන ලද සත්‍ය වියදම කොපමණද යන්න කාර්යසාධන වාර්තාවේ දක්වා නොතිබුණි. | රේඛීය අමාත්‍යාංශ හරහා ක්‍රියාත්මක කරන වැඩ සටහන් පාදක කරගෙන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය සකස් කර ඇත. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ප්‍රතිපාදන වෙන් කර ක්‍රියාත්මක කළ යුතුවීම. |

### 3.6 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ මුදුල්ල අමුණ හා කොටකිඹුලා කඩ අමුණ ඉදිකිරීම් ශ්‍රී ලංකා ගුවන් හමුදාව වෙත පවරා එයින් ඉතිරි වූ අයිතම් 94 කට අදාලව භාණ්ඩ ඒකක 2,506 ක් විගණන දිනය වන විටත් ගබඩාවේ පැවතුණි. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන තෙක් මෙම භාණ්ඩ කාර්යාලීය ගබඩාවේ සුරක්ෂිතව තැන්පත් කර ඇති බව. | ගබඩාවේ පවතින භාණ්ඩ පිළිබඳව විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතු වීම. |

### 3.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 317- ඕතොට දිවුල්ලැව වසමේ ප්‍රාදේශීය ලේකම්වරයාට අයත් ඉඩමක පුද්ගලයන් කිහිපදෙනෙකු වර්ෂ ගණනාවකට පෙර සිට අනවසරයෙන් පදිංචි වී සිටි අතර, අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරියේදී ලබා දීමට කටයුතු කරන බව නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් විසින් දක්වා ඇත. | අනවසර පදිංචිකරුවන් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 07 ක ඉඩම් හෙක්ටයාර් 9,486 ක් ගොඩනැගිලි 29 ක් හා පාපැදියක් වර්ෂ 02 සිට වර්ෂ 30 ක පමණ කාලයක් නිශ්කාර්යව පැවතුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ ඇති නිශ්කාර්ය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | නිශ්කාර්යව පවතින දේපළ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ඇ) භාවිතා කළ හැකි මට්ටමේ පවතින ජංගම අලෙවිකුටි 05 ක් භාවිතයට නොගෙන නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ නිශ්කාර්යව පැවතුණි. | වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ජංගම අලෙවි කුටි 05 ක් අළුත්වැඩියා කර ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ තබා ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාවිතයට නොගන්නා ලද දිග අඩි 10 පමණ වන ඇස්බැස්ටෝස් ශීට් 25 ක් ප්‍රයෝජනයට නොගෙන අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රයේ දිර්ඝ කාලයක් තිස්සේ ගොඩගසා තිබුණි. | පළාත් අයෝජන වැඩ සටහන යටතේ වැඩිපුර භාණ්ඩ ලබාදීමක් වන මෙම ඇස්බැස්ටෝස් ශීට් 25 බෞද්ධ මධ්‍යස්ථානයක් වෙත රැගෙන යන ලෙස දන්වා ඇතත් ගෙන ගොස් නොමැත. | - එම - |
| (ඉ) | ඉබ්බාගමුව හා නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුළ වර්ෂ 02 සිට 10 දක්වා කාලයක් ප්‍රයෝජනයට නොගන්නා ලද යතුරු පැදි 02 ක් නිශ්කාර්යව පැවතුණි. | නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යතුරු පැදිය වෙන්දේසි කිරීම සඳහා තබා ඇති බවත්, ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ යතුරු පැදිය සේවය හැරගිය ග්‍රාම නිලධාරියෙකු භාවිතා කර භාරදී ඇතත් නීත්‍යානුකූල හිමිකරු ඔහු නිසා අත්සන නොමැතිව පවරා ගැනීමට නොහැකි බැවින් මේ සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගෙන් උපදෙස් ඉල්ලා ඇත. | නිශ්කාර්යව පවතින දේපළ සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ගයක් ගත යුතුය. |
| (ඊ) | සමාජ සේවා දෙපාර්තමේන්තුව මඟින් නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබූ ට්‍රැක්ටරය හා බවුසර් රථය 2014 වර්ෂයේ සිටද, මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් ලබා දී තිබුණු ජල බවුසර් දෙකද දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිතව පැවතුණි. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අයත් ට්‍රැක්ටර් සහ බවුසර් රථ අළුත්වැඩියාව සඳහා ප්‍රතිපාදන ඉල්ලා ඇතත් ලැබී නොමැත. | නිශ්කාර්යව දිරාපත් වෙමින් පවතින වාහන ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නාගරික සීමාව තුළ පිහිටි රජය සතු දේපළ 26 ක් කුරුණෑගල මහානගර සභාවට පවරා දෙන ලෙස ඉල්ලා තිබුණු අතර, ඒවා විධිමත්ව පැවරීමක් සිදුකර නොතිබුණි. මෙම දේපළවලින් බොහෝමයක් වාණිජ පරමාර්ථයෙන් පවරා ගැනීම සඳහා ඉල්ලා තිබූ අතර, මේවා දිගුකාලීන බදු පදනම මත ලබාදී රජයට ආදායමක් උපයාගත හැකිව තිබියදී, මෙසේ මහානගර සභාවට | කුරුණෑගල මහා නගර සභාවට පැවරිය හැකි දේපළ පවරා දීමටත් අනෙකුත් දේපළ දිගු කාලීන බදුදීමේ හැකියාවක් ඇති බැවින් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | රජය සතු වටිනා දේපළ පැවරීමේදී ඒ ගැන සොයා බලා පැවරිය යුතු දේපළ පමණක් විධිමත් පරිදි පැවරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පැවරීමට කටයුතු කරමින් පැවතීම මතභේදයට තුඩුදෙන කරුණක් විය. | | |
| (ඖ) | කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හකුරුකුටියාව කටුවාවේවත්ත නමැති පර්චස් 169.77 ක රජයේ ඉඩම අනවසර පදිංචිකරුවන් විසින් අල්ලාගෙන තිබුණ අතර, ඔවුන් ඉවත් කිරීමට හෝ ඉඩම් නීත්‍යානුකූල කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අනවසරයෙන් පදිංචිවී සිටින පුද්ගලයින්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | රජයට අයත් ඉඩම් අනවසර පදිංචිකරුවන් අල්ලා ගැනීම සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඵ) | මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රත්කරව්ව ආයුවන්දම ග්‍රාමයේ රජයට අයත් කන්දක් සහිත ඉඩමක වසර ගණනාවක සිට විශාල වශයෙන් අනවසරයෙන් බොරළු කැණීම් සිදුකිරීම හේතුවෙන් පරිසර හානියක් සිදුවී තිබුණි. මේ සම්බන්ධයෙන් භූවිද්‍යා පතල් කැණීම් කාර්යාලයේ, මධ්‍යම පරිසර අධිකාරිය, පළාත් පරිසර අධිකාරිය වැනි ආයතනවල අනුමැතියකින් තොරව අනවසරයෙන් බොරළු කැපීම් සිදුකරන අතර, දීමනාපත්‍ර මඟින් පදිංචිකරුවන් කීපදෙනෙකු සඳහා මෙම ඉඩම ලබාදී තිබුණි. රජයට කිසිදු ප්‍රතිලාභයක් අත් නොවී බාහිර පාර්ශවයන් විසින් බොරළු විකිණීමෙන් විශාල ආදායමක් ලබාගන්නා අතර, මේ සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් විසින් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | කිසිදු අනවසර බොරළු කැපීමක් වර්තමානයේදී සිදු නොවන බවත් අනවසර බොරළු කැපීම් සිදුකරන දීමනාපත්‍ර ඉඩම් සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත දැනුම් දී ඇත. | රජයේ ඉඩම්වල අනවසර බොරළු කැණීම් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.8 පාඩු හා හානි**

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මදුල්ල අමුණ හා කොටකිඹුලාකඩ අමුණ ඉදිකිරීමෙන් පසු ඉතිරි වූ රු.52,000 ක් වටිනා සිමෙන්ති මිටි 56 ක් 2020 මැයි 01 දින ගබඩාව වෙත භාර දී තිබුණු අතර, විගණන දිනය වූ 2022 පෙබරවාරි 03 වන දින භාවිතයට ගත නොහැකිවී තිබීමෙන් පාඩු සිදුව තිබුණි. | අමුණ ඉදිකිරීමෙන් පසු ඉතිරි වූ සිමෙන්ති භාවිතයට ගත නොහැකි පරිදි ගල් ගැසී තිබීම හේතුවෙන් පාඩු සිදුවී තිබුණි. | ඉතිරි භාණ්ඩ නියමිත කාලය තුල වෙනත් කාර්යයකට හෝ යෙදවිය යුතු අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග නොගැනීම සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.9 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් 2017,2018 හා 2019 වර්ෂවලදී ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු හා දෙවන අදියර සඳහා වෙන්කර තිබුණු රු.241,462,756 ක ප්‍රතිපාදනවලින් රු.102,337,860 ක් වන සියයට 42 ක ප්‍රතිශතයක් පමණක් වියදම් කර සියයට 58 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. ක්ෂේත්‍රයේ නියුතු නිලධාරීන්ගේ හා ව්‍යාපාරයට සම්බන්ධ සාමාන්‍ය ජනතාවගේ මේ සම්බන්ධ දැනීමක් නොමැතිවීම හේතුවෙන් ව්‍යාපෘතියේ අරමුණු වූ යටිතල පහසුකම් ජීවනෝපාය සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය අවම මට්ටමක පැවති අතර, සමස්ථයක් ලෙස ගත් කළ ව්‍යාපෘතිය අක්‍රීය මට්ටමේ පැවතුණි. | 2020 වර්ෂයේ බලපෑ කොරෝනා තත්ත්වය හේතුවෙන් සමිති පැවැත්වීමට නොහැකි වීම සහ රාජ්‍ය නිලධාරීන්ට ගම්මානවල මහජනතාව හමුවීමට යාමට නොහැකිවීම මේ සඳහා බලපා ඇත. | ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය යටතේ වෙන්කරන ලද මුදල් නිසි පරිදි ප්‍රතිලාභීන් සඳහා ලබාදිය යුතුය. |

**3.10 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම්වරයා විසින් 2020 දෙසැම්බර් 21 දිනැති අංක HDM/SEVI/17/3 ප්‍රකාරව ප්‍රාදේශීය ලේකම්වරුන් ඇමතූ ලිපිය මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා කාර්යාල පරිශ්‍රවල ආරක්ෂක හා සනීපාරක්ෂක සේවාවන් ලබා ගැනීම සඳහා දැනට ක්‍රියාත්මක වන බහුකාර්යය සංවර්ධන දෙපාර්තමේන්තු සහායකයින් ඉදිරියේදී යෙදවීමට අපේක්ෂා කරන බව දක්වා ඇතත්, වර්ෂය අවසන් වන විටත් එම උපදෙස් ක්‍රියාත්මක කර නොතිබුණි. | ආරක්ෂක හා පවිත්‍රතා සේවා සඳහා බහුකාර්ය සංවර්ධන සහායකයින් ඉදිරියේදී යෙදවීමට අපේක්ෂා කරමි. | බහුකාර්ය සංවර්ධන සහායකයින්ගෙන් අපේක්ෂිත කාර්යයන් ඉටුකරගැනීම සඳහා යෙදවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2015 ජූලි 07 දිනැති අංක.BD/GPS/130/9/14/MCII ලිපිය ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම යාම, සේවයෙන් පහ කිරීම වැනි අවස්ථාවල 2014/ 2015 අයවැය යෝජනා යටතේ යතුරු පැදි ලබාගෙන තිබේනම් නිලධාරියා ඒ සඳහා ගෙවා තිබෙන මුදල අඩුකර ඉතිරි මුදල් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු බව දන්වා තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක එවැනි හේතුමත සේවයේ නිරත නොවන නිලධාරීන් 10 දෙනෙකුගෙන් යතුරු පැදි සඳහා අදාල රු.1,159,360 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | යතුරුපැදි සඳහා මුදල් අයකර ගැනීම වෙනුවෙන් ඉදිරියේදී නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බවට අදාල නිලධාරීන් දැනුවත් කරඇත. | චක්‍රලේඛ නියමයන්ට අනුකූලව සේවයේ නිරත නොවන නිලධාරීන්ගෙන් යතුරු පැදි සඳහා අයකළ යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වල්ගම්පත්තුව කෝරලේ 1201-වැදණ්ඩ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ දික්වැහැර ග්‍රාමයේ අංක 47/19/1 මු.පි.කු.1326 දරන පිඹුරෙහි අංක 54 දරන කොස්කැලය නමැති බිම් කැබැල්ල ප්‍රදාන පත්‍ර හිමිකරු විසින් පෞද්ගලික සන්නිවේදන කුළුණක් ඉදිකිරීම සඳහා 2009 වර්ෂයේදී සමාගමක් වෙත ලබාදී තිබුණි. ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ 2008 ජූලි 16 දිනැති අංක 2007/3(iii) චක්‍රලේඛය ප්‍රකාරව අදාල කොටස නැවත ප්‍රාදේශීය ලේකම්වරයා වෙත පවරාගෙන නොතිබුණි. ඉඩම පවරාගෙන සන්නිවේදන සමාගම සමඟ දීර්ඝ කාලීන බදුකරයකට එළඹ නොතිබීම හේතුවෙන් ඉඩම්හිමියා හා සමාගම අතර ඇතිකරගෙන තිබුණු ගිවිසුම ප්‍රකාරව මාසිකව රු.7000 බැගින් මාස 145 ක් සඳහා රු.1,015,000 ක ආදායම රජයට අහිමි වී තිබුණි. | ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර රජයට සිදුවී ඇති අලාභය අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 68 න් 36 කට වන අලි තර්ජන පැවති අතර, පසුගිය වර්ෂ 3 කදී වන අලි හානි වෙනුවෙන් රු.1,980,725 ක් ජීවිත, දේපළ හා වගා හානි ලෙස ගෙවා තිබුණි. එසේ වුවද විදුලි වැට සැකසීම්, ස්වාභාවික අලි වැට සකස් කිරීම් වැනි ස්ථිර විසඳුම් සකස් කිරීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | සෑම ග්‍රාම නිලධාරී වසමකටම විදුලි වැට සම්බන්ධව ප්‍රජාව දැනුවත් කළද, ව්‍යාපෘතියේ විවිධ කොන්දේසි නිසා වසම් 05 ක් හැර අනෙකුත් වසම්වලින් විදුලි වැඩ සම්බන්ධව ඉල්ලීම් ලැබී නොමැත. | වන අලින්ගෙන් සිදුවන ජීවත දේපළ හා වගා හානි සම්බන්ධයෙන් ගතයුතු වැලැක්වීමේ ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඉ) | ඉබ්බාගමුව, සහ පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ රජයේ විවිධ සංවර්ධන යෝජනා සඳහා ඉඩම් අත්පත් කර ගැනිමේදී පිළිවෙලින් ඉඩම් කට්ටි 3,136 ක් හා 52 ක් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වසර 01 සිට 49 දක්වා කාලයක් ප්‍රමාද වී තිබුණි. | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු කඩිනමින් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. | ඉඩම් අත්පත් කර ගැනීමේදී විධිමත් ක්‍රියාමාර්ග අනුගමනය කරමින් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයින් 207 දෙනෙකුට වැඩිපුර ගෙවා තිබූ රු.41,217,889 ක විශ්‍රාම වැටුපෙන් තවදුරටත් රු.22,685,025 ක මුදලක් අයකර ගත යුතුව තිබුණි. | විශ්‍රාමිකයින් සඳහා වැඩිපුර ගෙවා ඇති මුදල් ඔවුන්ගේ විශ්‍රාම වැටුපෙන් වාරික වශයෙන් අය කිරීමට දැනටමත් කටයුතු කර ඇත. | විශ්‍රාමිකයින් සඳහා ගෙවන ලද වැඩිපුර මුදල් කඩිනමින් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) | මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය විසින් 2019 දෙසැම්බර් 06 දිනැති හා අංක 01/2019 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව සපිරිගමක් සංවර්ධන වැඩසටහනේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරවීමේ බලය ප්‍රාදේශීය ලේකම් වෙත පවරා තිබුණි. එසේ වුවද, නාරම්මල හා බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රාදේශීය සභාව වෙත පවරා තිබුණු එම ඉදිකිරීම්වල ප්‍රමාද වීම් හේතුවෙන් අතැති බිල් ලෙස දක්නට ලැබුණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් සිටියදීත් ඔවුන් මෙවැනි සංවර්ධන ව්‍යාපෘතිවලට දායකත්වයක් ලබාදී නොතිබුණි. | සියලුම ව්‍යාපෘතිවල ගොනු පවත්වාගෙන යාම ප්‍රසම්පාදන ක්‍රමවේදය සිදුකිරීම වැනි කටයුතු නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් සිදුකරන අතර, බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යාම ව්‍යාපෘති ප්‍රමාණයක් ලබාදීමට වාරියපොල ප්‍රාදේශීය සභාව දැනුවත් කළද කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැත. | ව්‍යාපෘති අධීක්ෂණයට අදාල කාර්මික නිලධාරීන් සහ ආර්ථික සංවර්ධන නිලධාරීන්ගෙන් කාර්යභාරය නිවැරදිව කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා පවතින ක්‍රමවේදයන් ශක්තිමත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඌ) | සමෘද්ධි ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක් සඳහා නිෂ්පාදන ගම්මාන ක්‍රියාත්මක කිරීමට ලබාදුන් මුළු ප්‍රතිපාදන මුදල වූ රු.65,214,952 ක මුදලින් ව්‍යාපෘති ඉටු නොකිරීම හේතුවෙන් රු.33,142,728 ක ප්‍රතිපාදන මුදලක් එනම් සියයට 51 ක මුදලක් ඉතිරිව පැවතුණි. | භාණ්ඩ මිල ඉහළ යාම ඉදිකිරීම් ද්‍රව්‍යයන්හි පැවති හිඟකම, කොන්ත්‍රාත් කරුවන් ඉදිරිපත් නොවීම, අයහපත් කාලගුණය සහ කාලය ප්‍රමාණවත් නොවීම, වැනි හේතු නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. | ලබාදුන් ප්‍රතිපාදනවලින් ව්‍යාපෘති කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) | සපිරිගමක් ව්‍යාපෘතිය යටතේ ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉහළ වල්පොල සිට වැවගෙදර දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා ප්‍රමිතිය අනුව ගල් කියුබ් 30 ක්ද, වැලි කියුබ් 17 ක්ද, සිමෙන්ති මිටි 610 ක්ද යෙදවිය යුතු වුවත්, සංවර්ධන නිලධාරීන් ලොග් පොත අනුව ගල් කියුබ් 01 ක්, වැලි කියුබ් 03 සිමෙන්ති මිටි 200 ක් පමණක් යෙදවූ බව නිරීක්ෂණය විය. | සියලු සටහන් ලොග් පොත්වල සටහන් තබා නැති අතර, ඉදිරියේදී අධීක්ෂණය සිදුකරනු ලබන ව්‍යාපෘති සම්බන්ධ සියලු විස්තර ලොග් පොත්වල සටහන් තැබීමට කටයුතු කළ යුතු බව වසම් භාර සංවර්ධන නිලධාරීන් දැනුවත් කර ඇත. | ආර්ථික සංවර්ධන නිලධාරීන් ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද වාර්තා සහ සටහන් නිසි පරිදි පවත්වා ගැනීමට හා අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කළ යුතුය. |
| (ඒ) | සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් බිහිකිරීමේ වැඩසටහන යටතේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක් වෙත ලබාදුන් රු.166,653,664 ක ප්‍රතිපාදනවලින් රු.71,038,365 ක් වැයකර ඉතිරි ප්‍රතිපාදන රු.95,615,299 ක් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | අක් මුදල් නොලැබීම, කොරෝනා වසංගත රෝග තත්ත්වය, සැපයුම්කරුවන් මිල ගණන් ලබා නොදීම භාණ්ඩ හිඟතාවය හා දිනෙන් දින භාණ්ඩවල මිල ගණන් ඉහළයාම වැනි හේතූන් මේ සඳහා බලපා ඇත. | ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඔ) | සමෘද්ධි පවුල් ලක්ෂ 02 ක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් බිහිකිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිටින සමෘද්ධිලාභීන් සමෘද්ධිමත් වූ පසු ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි සහනාධාර ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි. | වැඩසටහනට අදාලව භාණ්ඩ ආධාර ලබාගත් ප්‍රතිලාභීන්ගේ සමෘද්ධි සහනාධාරය ඉවත්කිරීම සඳහා වසම්වල ග්‍රාමීය කමිටු වෙත යොමුකර ඇත. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ සිටින සමෘද්ධි ලාභීන් සමෘද්ධිමත් වූ පසු විධිමත් පරිදි හඳුනාගෙන ඉවත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඕ) | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය මඟින් 2017 වර්ෂයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක කුඩා කර්මාන්ත ඇඟලුම් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.122,264,445 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ලබාදී තිබුණද, විගණන අවස්ථාව වන විටත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මකව නොපැවති අතර, භාණ්ඩ හා උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | පොල්ගහවෙල, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකෙහි පුහුණුව ලබා දීමෙන් පසු වැඩ ආරම්භ කිරීමේදී බෝහෝ ප්‍රායෝගික ගැටළු මතුව ඇති අතර, අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ මතුවී ඇති සාධාරණ ප්‍රායෝගික ගැටළු මත සියලු මධ්‍යස්ථාන තාවකාලික වසා දැමීම් සිදුවී ඇත. | නිශ්කාර්යව පවතින යන්ත්‍ර හා උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් තිරසර සංවර්ධන අරමුණු 17 ක් හඳුනාගෙන තිබුණ අතර 7 වන අරමුණ වූ සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වසනීය තිරසර සහ නවීන බලශක්ති සැපයුම් තහවුරු කිරීම සඳහා වර්තමානයේ පවතින විදුලි අර්බුදයට පිළියමක් වූ නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශවීම යන අත්‍යවශ්‍ය අරමුණු සඳහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන්කර නොතිබීම හේතුවෙන් වර්ෂය අවසානයේ කාර්යසාධනය ශූන්‍ය අගයක්ව පැවතුණි. | පොළව මත සවිකරන සූර්යබල උත්පාදන ව්‍යාපෘති 1,000 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, මෙම වැඩසටහන ඉටු කිරීමට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් නොකළ බැවින් වර්ෂය අවසානයේ කාර්යසාධනය ශූන්‍ය අගයක් ගෙන ඇත. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාකාරී සැලැස්මට අනුව හැකිතාක් දුරට ක්‍රියාත්මක කළ යුතුය. |

**5. යහපාලනය**

**5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හමන්ගල්ල හා තඹකන්ද ග්‍රාමී නිලධාරී වසම්වල කළුගල් හා බොරළු කැණීම් ස්ථාන | බොරළු කැපීම්වලට විරෝධය දක්වා ප්‍රදේශවාසීන් විසින් | අනවසර කැණීම් සම්බන්ධයෙන් පවතින මහජන පැමිණිලි හා |

| | | |
|---|---|---|
| 02 ක් සම්බන්ධයෙන් වර්ෂ ගණනාවක සිට මහජන පැමිණිලි හා විරෝධතා ලැබී තිබුණද එම මහජන ගැටලු සම්බන්ධයෙන් නිසි විසඳුමක් ලැබී නොතිබුණි. | ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර ඇති අතර, එහි තීරණයන් මෙතෙක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලැබී නොමැත. | විරෝධතා විසඳීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතුය. |

**6. මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නාරම්මල, ඉබ්බාගමුව, පඩුවස්නුවර (බටහිර) හා කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුගේ හා තෘතීයික මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකුගේ පුරප්පාඩු පවතින අතර, එම පුරප්පාඩු සම්පූර්ණ කරවාගෙන නොතිබුණි. | නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී තනතුරේ වැඩ බැලීමට ගණකාධිකාරී වරියක් පත් කර ඇති අතර, ඉබ්බාගමුව, පඩුවස්නුවර (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ස්ථානමාරුවීම්, විශ්‍රාමයාම වැනි අවස්ථාවලදී පුරප්පාඩු නොපවති. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) අනුමත කාර්ය මණ්ඩලයේ නොමැති භාෂා පරිවර්තක නිලධාරී තනතුර සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකට සේවකයින් 3 ක් බඳවාගෙන තිබුණි. | භාෂා පරිවර්තන තනතුරු සඳහා අනුමැතිය ලැබී නොමැත. | භාෂා පරිවර්තක තනතුරු අනුමත කර ගත යුතුය. |